ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2096/48 - 2018 නොවැම්බර් මස 07 වැනි බදාදා - 2018.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින්**
**(460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මාගේ යොමු අංකය.*: 2/3/1/4/4.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/2/2015/HA/299

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ආණ්ඩුවට ගැනීමට අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* -

මෙහි මහජන කටයුත්තක් යනු අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹන්ගඟකෝරළේ සුළු කොට්ඨාසයේ පල්ලේතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පල්ලේතැන්න ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2018.08.23 දිනැතිව සකස් කර ඇති මූ.පි.මා 1729 නමැති මූලික පිඹුරෙහි කැබලි අක්ෂර A වශයෙන් දක්වා ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.3744 ක් වන ඕපල්ගලවත්ත නමැති ඉඩම.

කැබලි අක්ෂර - A

උතුරට: අඹන්ගඟකෝරළේ අධ්‍යාපන කාර්යාලය පිහිටි පල්ලේතැන්න වත්ත, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; නැගෙනහිරට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ එස්. සිවකුමාර් සහ තවත් අය හිමිකම් කියන පල්ලේතැන්න වත්ත; බටහිර: මාර්ගය සහ එස්. සිවකුමාර් සහ තවත් අය හිමිකම් කියන පල්ලේතැන්න වත්ත සහ අඹන්ගඟකෝරළේ අධ්‍යාපන කාර්යාලය පිහිටි පල්ලේතැන්න වත්ත; ඉඩමේ හිමිකම් කියන්නාගේ නම: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.3744.

ඉහත නම් සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.12.21 වැනි දින පෙ.ව. 10.00ට අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018.12.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩමට ඇති හිමිකම් තහවුරු කිරීම සඳහා ඔප්පු හා අදාල ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
මාතලේ දිස්ත්‍රික්කය.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

11-905

---

## ශුද්ධි පත්‍රය

### 1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

*මගේ යොමු අංකය.*: HAK/LAN/1/7.

1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ 2018 ඔක්තෝබර් මස 03 වැනි දින අංක 2091/46 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* III වන කොටසේ පළ කරන ලද මගේ යොමු අංක HAK/LAN/1/7 සහ 2018 ඔක්තෝබර් මස 28 වැනි දින දරන දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාව ද, වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කල යුතු දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

*9 වන වගන්තිය හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව* -
2018.12.17 දින පෙ.ව. 10.00

*වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කල යුතු දිනය* -
2018.12.10 දින පෙ.ව. 10.00

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-906

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.